**බලපිටිය ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කර්මාන්ත 06 ක් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.2,042,000 ක ප්‍රාග්ධන ආධාර මුදල් ලැබිය යුතු ආධාර ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම නිසා ණයගැතියෝ හා ප්‍රාග්ධන ආධාර එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

(ආ) දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස පිළිරුව පිහිටි භූමියේ මායිම් ආරක්ෂණය පිණිස කොන්ක්‍රීට් ග්‍රීල් යොදා තාප්පය ඉදිකිරීම වෙනුවෙන් 2014 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලැබිය යුතු රු.150,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලෙස මූල්‍ය ප්‍රකාශන වලට නොගැනීම නිසා එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා ණයගැතියන් අඩුවෙන් දැක්විණි.

(ඇ) කර්මාන්ත 02 ක් සඳහා රු.9,086 ක් වැඩියෙන් දැක්වීම හා කර්මාන්ත 06 ක් සඳහා රු.1,229,872 ක ප්‍රතිපාදන නොසැලසීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය හා ණයහිමියන් රු.1,220,786 ක් අඩුවෙන් දැක්විණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ රු.61,050 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 36 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ප්‍රාග්ධනිත කිරීම නිසා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

(ඉ) සභාව සතුව ඇති අක්කර 02 පර්චස් 16 ක ප්‍රමාණයේ ඉඩම් 09 ක් තක්සේරු කර වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු උසාවි දඩ මුදල රු.2,023,413 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.2,116,747 ක් ලෙස දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියෝ රු.93,334 කින් වැඩියෙන් දැක්විණි.

(උ) ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු මුද්දර ගාස්තු ආදායම් රු.36,811,825 ක් වුවද, හිඟහිටි වෙනත් ආදායම් ණයගැතියන්ගෙන් අඩුකර තිබුණේ රු.35,488,256 කි. ඒ අනුව ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.1,323,569 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.1,323,569 ක් වැඩියෙන් දැක්විණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.29,555,121 ක් සියලු වැඩසටහන් අතර විභජනය නොකර, එක් වැඩසටහනක් යටතේ දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ රු.273,420 ක වරිපනම් අධි ගාස්තු මුදල වරෙන්තු ගාස්තු හා දඩ වශයෙන් නොපෙන්වා වරිපනම් හා බදු වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ දී වියදම් ණයහිමියෝ රු.2,029,719 ක් ප්‍රතිපාදනය නොකර සමාලෝචිත වර්ෂයේ දී එම ගෙවීම රු.427,730 ක් ලෙස ප්‍රතිපාදනය කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල වියදම් ණයහිමියෝ හා සමුච්චිත අරමුදල පිළිවෙලින් රු.1,601,989කින් අඩුවෙන් හා වැඩියෙන් දැක්විණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 05 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.2,645,313 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.174,901,445 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛන, යාවත්කාලීන කරන ලද ණයගැති හා ණයහිමි ලේඛන, ශේෂ සනාථ සහතිකය හා කාල විශ්ලේෂණ සහ දෙසැම්බර් 31 දිනට ශේෂය දැක්වෙන පරිදි පිළියෙල කළ තැන්පත් ලේඛන පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.24,014,441 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.22,932,475 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

---

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතු රු.12,096,281 ක් වූ වරිපනම් බදු සහ රු.24,750 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) සහ 152(4) වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.1,074,209 ක උසාවි දඩ හා රු.44,836,651 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**2.3 අධිභාර**

---

1987අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.178,610 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාපති ඇතුළු සියළුම සභිකයින් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවද, සභිකයින් 10 දෙනෙකු විසින් 2014 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි. එමෙන්ම 2013 වර්ෂය සඳහා සභිකයින් 08 ක් හා 2012 වර්ෂය සඳහා සභිකයින් 05 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

**කොහිලවගුරේ වත්ත ඉඩම් වෙන්දේසිය**

---

කොහිලවගුරේ වත්ත අක්කර 01 යි, රූඩ් 01 යි, පර්චස් 15.6 ක ඉඩම පුද්ගලික සමාගමක් විසින් 2013 මැයි 09 දිනැති පිඹුරු අංක : 2013/172 මඟින් කැබලි 25 කට බෙදා වෙන්කර තිබූ අතර, සභාව විසින් නේවාසික භාවිතය සඳහා 2013 නොවැම්බර් 13 දින සංවර්ධන බලපත්‍රය අනුමත කර තිබුණ ද විගණන දිනය වූ 2015 ජනවාරි 21 දින වන විටද අනුකූලතා සහතිකය ලබාගෙන නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

---

සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පුවක් හෝ පැවරුම් නියෝගයක් සභාව සතුව නොතිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

**අයවැය පාලනය**

**-------------------**

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5.** **පද්ධති හා පාලන**

**---------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය